# සුපිරිසිදු වෙරළක් - කසළින් තොර රටක් උදෙසා....

# ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග

එච්. එම්. ප්‍රියංගා පෙරේරා
(BSc-Marine & Fisheries Science, MSc-Aquatic Bio-resources Management & Aquaculture)
දිස්ත්‍රික් සමුද්‍ර පරිසර නිලධාරි
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ප්‍රාදේශීය කාර්යාලය - පුත්තලම

**ලෝකයේ සමස්ත ජනගහන සංඛ්‍යාත්මකව ඉහළ යෑම, ආර්ථික රටාවන්ගේ සිදුවන විප්ලවයන්, නිෂ්පාදන ක්‍රියාවලීනගේ විවිධාංගීකරණය, වර්තමානයේදී ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල ඝන අපද්‍රව්‍ය එක් රැස්වීමත් ඒ ආශ්‍රිතව සබැඳි පාරිසරික සහ සෞඛ්‍යමය ගැටළුකාරී තත්ත්වයන් උද්ගතවීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක වේ. ශ්‍රී ලංකාවෙහි ද මේ හා සමගාමීව වෙරළබඩ කලාපයන්හී සදුවන සීඝ්‍ර නාගරීකකරණයත්, කර්මාන්ත ස්ථාපිතවීමත් ඒ සමග මානව පරිභොජන රටාවන්ගේ වෙනස්වීම් සිදුවීමත් යන කාරණා හේතුවෙන් වෙරළ සහ ඒ ආශ්‍රිත පරිසර පද්ධතින් විවිධාකාර වු ඝන අපද්‍රව්‍යයන්ගෙන් පිරී පැවතීම සුලබ දසුනකි. අසල්වැසි රාජ්‍යයන්ගෙන් සාගරයට මුදා හැරෙන අපද්‍රව්‍ය මෙන්ම ගෘහාශ්‍රිත සහ කාර්මික අපද්‍රව්‍ය බොහෝමයක අවසානය මුහුදු වෙරළ හෝ ඒ ආශ්‍රිත පරිසර පද්ධතික් වන්නේ එවැනි ප්‍රදේශ පොදු සම්පත් ගණයෙහි ලා සැලකෙන නිසාය. ස්වාභාව ධර්මය විසින් අප වෙත ලබා දී ඇති දායාදයන් අතුරින් සයුර වෙරළ කලපු කඩොලාන පරිසර පද්ධතීන් ගංගා මෝය ආදිය දූපත් රාජ්‍යයක් වන අපහට ඉතා අගනේය. දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය රැඳී තිබෙන ප්‍රධාන ස්වාභාවික ස්ථානයන් අතුරින් ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළට ප්‍රමුඛ වේ.**

ශ්‍රී ලංකාව තුළ කසළ කළමනාකරණ ක්‍රියාවලියෙහි මුලික වගකීම දරන්නේ පළාත් පාලන ආයතන විසිනි. ඒ සඳහා ඵලදායී, කාර්යක්ෂම, ස්ථිරසාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම ඔවුන් සතු ප්‍රධාන අභියෝගයයි. ඒ හැරුණු කොට කසළ කළමනාකරණයේදි මධ්‍යම රජය මුලිකව පළාත් පාලන ආයතන, රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන ද ඇතුළුව කර්මාන්ත හිමිකරුවෝද මෙන්ම සමස්ත පුරවැසියෝද එම ක්‍රියාදාමයෙහිම ප්‍රධාන පාර්ශවකරුවෝ වෙති. මෙහිදි ඔවුන් එකිනෙකා විසින් සිදුකළ යුතු මෙහෙවර සහ ඒවායෙහි ප්‍රමුඛතා එකින්එක වෙනස් වුවද දේශය තුළ ක්‍රියාත්මක කසළ කළමනාකරණ ක්‍රියාවලිය සාර්ථක විම සඳහා දායක වේ.

කසළ කළමනාකරණ ක්‍රමවේදයන් පවත්වා ගැනීම සඳහා පොදු ජනතාවගේ දායකත්වය අත්‍යාවශ්‍ය වුවද ක්‍රියාවලියේ වගකීම නිබදවම පළාත්පාළන සහ ප්‍රාදේශීය පාළන ආයතන මත රදා පවතින්නේයැයි පොදු මහජනතාව බහුතරයක් විශ්වාසකරයි. කෙසේ වෙතත් සිදුකරන ලද අධ්‍යයනයන්ගෙන් පෙනී ගිය කරුණක් වනුයේ මෙම කරුණ සම්බන්ධව ඇතැමේ අවස්ථාවල පළාත් පාලන පාලනාධි-කාරීන් සිය උපරිම හැකියාව අභිබවා යා නොහැකි ප්‍රායෝගික ගැටළු රැසකට මුහුණ දෙන බවයි. ඒවා අතර කසළ කළමණාකාරන ක්‍රියාවලිය සඳහා යෙදවිය හැකි ප්‍රමාණාත්මක මානව සම්පත් තම ආයතන සතු නොවිම, මුල්‍යමය සම්පත් හිඟකම, දිනෙන් දින උඝ්‍රවන ගැටළුවේ

සංකීර්ණත්වය, තාක්ෂණ හිඟතාව සහ නිසි ක්‍රමවේද නිසි ලෙස දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කිරිමේ නොහැකියාව ප්‍රධාන වේ. මෙම සේවාව නිසි පරිදි සැපයීමට අවශ්‍ය වන මානව සහ භෞතික සම්පත් අතර පුහුණු ශ්‍රමිකයින්, තාක්ෂණික මෙවලම්, රථවාහන, නිසි පරිදි ඉදිවු යටිතල පහසුකම් දැක්විය හැකිය. එසේම මෙම කර්තව්‍යයේ සාර්ථකත්වය සඳහා අපද්‍රව්‍ය බැහැර කරන්නන්ගේ සක්‍රිය දායකත්වය ද අත්‍යාවශ්‍ය වේ. මේ නිසා මෙම කර්තව්‍යයේදී ප්‍රධාන පාර්ශව-කරුවන් වෙත සමස්ත ක්‍රමවේදය තුළ දී පැවරෙන නියමාකාර වගකීම පිළිබඳවද කාර්යක්-ෂමතාව සහ ඵලදායීතාව පවත්වා ගැනීමට ඒ එක් එක් පාර්ශව විසින් අනුගමනය කළ යුතු ප්‍රධාන පියවරයන් පිළිබඳවද සවිස්තරාත්මක අවබෝධයක් සෑම සියලු දෙනා සතු විය යුතුය. මේ සඳහා ජාතික මට්ටමින් ගොඩනගා ඇති නීති රෙගුලාසි සහ සැලසුමේ ක්‍රියාත්ම කිරිමට උත්සහ දැරිම අප සැමගේ වගකීම වේ. මෙහිදී කසළ කළමනාකරණය යනු විවිධ මානයන් කිහිපයක් ඔස්සේ විසඳුමේ සෙවිය යුතු ගැටලුවක් බව ප්‍රථමයෙන් තේරුම් ගත යුතුය

මේ සඳහා සියලුම පාර්ශවයන් අතර මනා සම්බන්ධිකරණයක් පැවතීම ප්‍රධාන අවශ්‍ය-තාවක් වේ. නමුත් වර්තමානයේ අප රටේ බහුතරක් විසින් නිසි කසළ කළමනාකරණය, ප්‍රමාණවත් උපකරණ සහ රථ වාහන පැවතීම මත සාර්ථකත්වයට පත් කර ගත හැකි ඉලක්කයක් ලෙස විශ්වාස කළද ඵලදායි ව්‍යාපෘතීන් සඳහා තාක්ෂණය. සමාජ ආර්ථික රටාව, සමාජයේ ධනාත්මක ආකල්ප, දැනුවත් බව, නෛතික පසුබිම මෙන්ම ආයතිනක හැකියාවන්ද පොදු ජනතාවගේ කැපවීමද හේතුවන බව පැහැදිලිය. මෙම සියලු අංශයන්ගේ සම්බන්ධිකරණය නිසි ඵලදායී කසළ කළමනාකරණ ක්‍රමවේදයන්ගේ දිගු කාලීන පැවැත්මක් තහවුරු කරයි.

මෙවැනි ජාතික කර්තව්‍යයකදී නිසි සැලසුම්කරණය, සංවිධානය සහ සම්බන්ධි-කරණය, ක්‍රියාත්මක කරවීම, ක්‍රියාවලියේ පැවැත්ම පාලනය සහ දුර්වලතා හඳුනාගෙන මගහරවාගෙන නිසි මාර්ගයට යොමු කරවීම සහ පසු විපරම යන අංගයන් පිළිබඳව සැලකිලිමත් විය යුතුමය.

නිසි පරිදි ක්‍රියාත්මක අපද්‍රව්‍ය කළමණාකරන සැලැස්මක දි සැලකිමත් විය යුතු අංග සමහරක් පහත පරිදි වේ.

**කසළ ජනනය**

1. ප්‍රදේශයේ ජීවත් වන ජනගහනය. ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම සහ ආදායම් ප්‍රමාණය
2. දැනුවත් කිරිමේ වැඩසටහන්
3. ප්‍රදේශයේ ජීවත් වන ස්ත්‍රී පුරුෂ ප්‍රතිශතය
4. කසළ එක්රැස් කරන්නන්
5. සමාජ කණ්ඩායම් වල බලපෑමේ
6. නිපදවන කසළවල ස්වාභාවය

**කසළ එක්රැස් කිරිම සහ බැහැරලීම**

1. කසළ දැමීම සඳහා වන ස්ථාන සහ බඳුන් ස්ථානගත කිරිම
2. කසළ එක්රැස් කිරිම සහ ප්‍රවාහනය සඳහා වන පැහැදිලි මාර්ග රටාව
3. කසළ එක්රැස් කිරිම සඳහා වන කාලය සහ සැලැස්ම පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරිම
4. යටිතල පහසුකම්
5. මාර්ග පද්ධතින්ගේ ස්වාභාවය සහ ප්‍රවාහනයේ පහසුව
6. ප්‍රවාහනය සඳහා සඳහා අවශ්‍ය රථ වාහන
7. කසළ බැහැර කිරිමේ බඳුන් ස්ථානගත කිරිම සහ ඒවා අතර දුර ප්‍රමාණයපවත්වා


**පිරිපහදු කිරිම /ප්‍රතිචක්‍රීකරණය**

1. අදාල ක්‍රමවේද පිළිබඳ දැනුම
2. සුදුසු පරිදි පිහිටියාවු යටිතල පහසුකම්
3. සාම්ප්‍රදායික දැනුම
4. මහජනතාව අතරින් බිහිවු සංවිධාන
5. ප්‍රතිචක්‍රීකරණය සඳහා වන වෙළඳපොළ
6. ප්‍රතිචක්‍රීකරණය සඳහා සහභාගිවන ආයතන වල වෘත්තීමය ස්වාභාවය
7. මුල්‍යමය දායකත්වය
8. එක්රැස් කිරිමේ කාර්යක්ෂමතාව
9. අඩු වියදම් තාක්ෂණය

පසුගිය දශක කිහිපය පුරා ශ්‍රී ලංකාවේ මෙම කාර්යය සම්බන්ධ විවිධ මට්ටමේ ව්‍යාපෘතීන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල මෙහෙයවීමෙන් ක්‍රියාත්මක විය. ඒ අතරින් ඇතැමේ ව්‍යාපෘතීන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල අත්පත් කර ගත්ත ද බොහෝ ව්‍යාපෘතීන් අසාර්ථක විය. බොහෝවිට එවැනි අසාර්ථක තත්ත්වයන් උද්ගතවීමට ව්‍යාපෘති මෙහෙයවන්නන් සහ අපද්‍රව්‍ය නිපදවීමට දායකවන්නන් යන දෙකොට්ඨාශයම අඩු වැඩි වශයෙන් දායක වන අතර ඔවුන් තුළ පවතින පහත දැක්වෙන දුර්වලතා හේතු සාධක ලෙස දැක්විය හැක.







### නිෂ්පාදනයේදී හො පාරිභෝජනයේදී අපද්‍රව්‍ය නිපදවීමට දායකවන්නන්.

1. ඔවුන් තුළ අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රම වේදය පිළිබද අවශ්‍යතාව නොමැතිකම
2. ඔවුන් තුළ අදාළ ක්‍රමවේදයන් පිළිබද දැනුම සහ අවබොධය නොමැතිවීම
3. ඝන අපද්‍රව්‍ය කළමණාකරයේ ප්‍රතිලාභ පිළිබද අවබෝධය නොමැතිවිම
4. පෙර ආරම්භ කළ වෙනත් සමාන අසාර්ථක ව්‍යාපෘතින් පිළිබද අත්දැකීමේ නිසා විශ්වාසය හීන විම
5. අමතර පිරිවැයක් දැරීමට සිදුවීම පිළිබද අකමැත්ත
6. අමතර මානව සම්පත් ප්‍රමාණයක් යෙදවීමේ නොහැකියාව
7. නව ක්‍රමවේදයන්ට අනුගත වීමේ නො-හැකියාව හෝ අකමැත්ත
8. නිසි උපදෙස් නොලැබීම නිසි පරිදි දැනුවත් නොවීම
9. ආකල්පමය විෂමතා

### ව්‍යාපෘති මෙහෙයවන්නන්

1. ව්‍යාපෘතියේ ප්‍රතිලාභ පැහැදිලි නොවීම
2. නිසි පරිදි පාර්ශවකරුවන් දැනුවත් නොකිරීම
3. පාර්ශවකරුවන් තුළ විශ්වාසනීයත්වය ගොඩනැගීමට අපොහොසත්විම
4. පසුවිපරම් නොමැතිවීම
5. ප්‍රායෝගිකත්වයෙන් දුරස්වීම

බොහෝවිට අප රටතුළ මෙවැනි ව්‍යාපෘති ආරම්භ වන්නේ සමාජ සුබසාධනය පදනම් කොටගෙනය. ඉන් මුල්‍යමය ප්‍රතිලාභ ඉපැයීම සෘජුව රජය අපේක්ෂා නොකරයි. මුදල් ප්‍රමුඛ වූ මේ ජීවන රටාවෙහි මේ හේතුව නිසාවෙන්ම පාර්ශවකරුවන් පිරිසිදු පරිසරයක් ලැබීමෙන් පමණක් සෑහීමට පත්වන්නේ නැත. තමන් දරණ වියදමට හෝ වෙහෙසට සාපේක්ෂව වැඩි යමක් බොහෝ විට බහුතරය අපේක්ෂා කරයි. අපද්‍රව්‍ය කළමණාකරණයේ අවශ්‍යතාවය දිනෙන් දින වර්ධනය වේ. ලොව දියුණුයැයි සම්මත රටවල මේ හා සම්බන්ධ අංශ මහා පරිමාණ ලාභ උපයන ව්‍යාපාර මට්ටමට සාරථකත්වයක් ලබා ඇත. අපද්‍රව්‍ය නිපදවන්නන් විසින් ද අපද්‍රව්‍ය

කළමණාකරණය සඳහා මුල්‍යමය දායකත්වයක් දක්වයි. එනම් අපද්‍රව්‍ය කළමණාකරණය මුදලක් ගෙවා ලබා ගන්නා සේවාවක් බවට එම රටවල් පත් කොට ඇත. අප රටෙහි නොමිලේ සමාජ සත්කාරයක් ලෙස සිදු කෙරෙන මෙම කාර්යයයේදී මහජන දායකත්වය අවම මට්ටමක දක්නට ලැබේ.

එසේම ඝන අපද්‍රව්‍ය කළමණාකාරණ සේවාව සැපයීම සඳහා යම් පිරිවැයක් දැරීමට සිදුවේ. නමුත් අප රට තුළදී අවසානයේදී එයින් ලබන ප්‍රතිඵලය සාමාන්‍යයෙන් මෙම සේවාවේ දී බොහෝ විට ඒ සඳහා යන වියදම හෝ සම්පූර්ණ කරගැනීමට තරම් ප්‍රමාණවත් වන තරම් ආදායමක් ඉපයීම සඳහා සමත් නොවේ. මේ නිසා මේ සඳහා යොමුවන්නන් ප්‍රමාණය අවම වේ. ප්‍රතිචක්‍රීනරණය සිදු කිරීම සහ කොම්පෝස්ට් සහ ජීව වායු නිපදවීම යන අංශය අප රට තුළ ක්‍රියාත්මක අතර ඒ සඳහා යොමුවන පිරිසේ හිගයක් දක්නට ලැබේ. මේ සඳහා අවශ්‍ය මූලික ප්‍රාග්ධනයක් අවශ්‍ය වීම සහ අපද්‍රව්‍ය සහ බැඳුණු වෘත්තීන් පිළිබඳව ඇති සමාජ සම්මතයන් නිසා බොහෝ දෙනෙකු සතුව කසළ කළමනා-කරණයෙහි වෘත්තීමය ස්වාභාවය පිළිබඳ ඇත්තේ අඩු තක්සේරුවකි. එම නිසා ඒ සඳහා යොමුවන්නන් ප්‍රමාණය අවමය.

මේ හේතුවෙන් සියලු කාරණා අංග සම්පූර්ණ කොටගත් නිසි අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රමවේදයක් දේශීය වශයෙන් ගොඩනැගීමේ අවශ්‍යතාව අතීතයට සාපේක්ෂව අනාගතයේදී පැන නැගෙනු ඇත. එසේ හෙයින් අපද්‍රව්‍ය සම්පතක් කොට ගනිමින් ඉන් දේශීය ආර්ථිකය ගොඩ නැංවීමට අවශ්‍ය දායකත්වය ලබා ගැනීමේ සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම වර්තමානයේදී අප සතු ප්‍රධාන අභියෝගයයි. එය ජයගැනීම යනු ශ්‍රී ලංකාව වනාහී පරිසර හිතකාමී ජනතාවක් වෙසෙන, පිරිසිදු, සුන්දර ඉන්දියන් සාගරයේ දිදුලන මුතු ඇටය බව ලෝකයා වෙත තහවුරු කිරීමට දායකවීමය.

